# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2151/27 - 2019 නොවැම්බර් මස 27 වැනි බදාදා - 2019.11.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළයේ, අංක ඊ434ඊ, නබඩගහවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නබඩගහවත්ත ගමේ අවසාන ගම් පිඹුරු අංක 346හි පහත විස්තර සඳහන් කර ඇති කැබලි අංක 1836, 1838 සහ 1839.

01. **කැබලි අංක 1836**
ඉඩමේ නම: දඩුයායහේන; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය (අනවසර වගාකරු - මොහොමදු හනීෆා මොහොමඩ් නව්සාඩ්); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0003.

02. **කැබලි අංක 1838**
ඉඩමේ නම: දඩුයායවත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය (අනවසර වගාකරු - තව්ෆීක් මනාස්); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0008.

03. **කැබලි අංක 1839**
ඉඩමේ නම: දඩුයායවත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය (අනවසර වගාකරු - මොහොමදු හනීෆා මොහොමඩ් නව්සාඩ්); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0708.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.12.12 වැනි දින පූ.භා. 9.30ට ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද 2019.12.05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

එම්. යූ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල කොට්ඨාසය.

2019 නොවැම්බර් මස 25 වැනි දින,
ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-362

1A - G31575 – 15 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*